# ප්‍රධාන ජනගහන බලකා කමිටුව ශ්‍රී ලංකාව

**මෙහෙයුම් මාර්ගෝපදේශ**

**2023 සැප්තැම්බර් 8**

# ප්‍රධාන ජනගහන බලකා කමිටුව ශ්‍රී ලංකාව

# මෙහෙයුම් මාර්ගෝපදේශ


**1. *හැදින්වීම* ...... 1**

**2. *අරමුණු* ...... 1**

**2.1** පොදු අරමුණ ...... 1

**2.2** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ විශේෂිත අරමුණු වන්නේ: ...... 1

**2.2.1** වැඩසටහන් සහ වැඩසටහන් සැලසුම ...... 1

**2.2.2** සන්නිවේදනය ...... 1

**2.2.3** මූල්‍යාකරණය සහ තිරසාරභාවය ...... 2

**2.2.4** ධාරිතා වර්ධනය ...... 2

**3. *ප්‍රධාන ජනගහන බලකායේ සාමාජිකත්වය* ...... 2**

**3.1** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකත්ව සංයුතිය ...... 2

**3.2** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායට සාමාජියන් තෝරා ගැනීම ...... 2

**3.3** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයෙකු වීම සඳහා අවශ්‍යතා ...... 3

3.4 ආවස්ථික ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා කමිටු සාමාජිකයෙකු ගේ කාර්‍යභාරය ...... 3

**3.5** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා සාමාජිකයන් ගේ භූමිකාව සහ වගකීම් ...... 3

**3.6** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකත්වය දරණ දේශීය සම්බන්ධිකරණ කමිටුවේ සිවිල් සමාජ සාමාජිකයින්ගේ භූමිකාවන් සහ වගකීම් ...... 4

**3.7** සාමාජිකත්වය අවසාන කිරීම ...... 4

**3.8** ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සභාපති, උප සභාපති සහ ලේකම් පත්කිරීම ...... 4

3.9 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සභාපති/උප සභාපති දෙපලගේ භූමිකාවන් සහ වගකීම් ...... 5

**3.10** ලේකම් ගේ කාර්‍යභාරය ...... 5

**4. *පීඩාවට පත් ප්‍රධාන ජනගහන බලකා කමිටු රැස්වීම් පැවැත්වීම* ...... 5**

**5. *තීරණ ගැනීමේ ක්‍රියාවලිය* ...... 5**

**6. *සන්නිවේදනය* ...... 6**

6.1 දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලය සහ ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය අතර සන්නිවේදනය ...... 6

6.2 ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය සහ සහභාගිත්ව කොට්ඨාශ අතර සන්නිවේදනය ...... 6

6.3 සන්නිවේදන උප කමිටුව ...... 6

**7. *අනුකමිටු* ...... 6**

# ශ්‍රී ලංකා ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය

මෙහෙයුම් මාර්ගෝපදේශ

## 1. හැඳින්වීම

**ශ්‍රී ලංකා ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකායෙහි (KPTF) අපේක්ෂාව වන්නේ මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය (HIV) සහ ක්ෂය රෝගය (TB) සමඟ ජීවත්වන, පීඩාවට පත්වන සහ/හෝ අවදානමට ලක්ව සිටින සියලුම ප්‍රජාවන්ගේ සහ සිවිල් සමාජවල හඬ එක් කිරීමෙහි ලා ප්‍රධාන, ආන්තික සහ අවදානමට ලක්විය හැකි ජනගහනය විසින් ජාතික මට්ටමේ දී දක්වන HIV සහ TB ප්‍රතිචාර කෙරෙහි ඔවුන්ගේ අර්ථවත් සහ ඵලදායී නියැලීම සහතික කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීම පිණිස වේදිකාවක් සැපයීමය.**

ශ්‍රී ලංකාව මැලේරියාව තුරන් කර ඇති නමුත්, ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායෙහි (KPTF) ප්‍රමුඛතාවයන් තුළ අවධානය මෙන්ම ප්‍රමුඛතාවය ද යොමු කරන ප්‍රදේශයක් ලෙස මැලේරියාව පවතින බවට වග බලා ගැනෙනු ඇත.

පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමි (MSM), කාන්තා සහ පිරිමි ලිංගික ශ්‍රමිකයින් (FSW සහ MSW), සංක්‍රාන්ති ලිංගික පිරිමින් සහ කාන්තාවන්, මත්ද්‍රව්‍ය භාවිතා කරන/එන්නත් කරන පුද්ගලයින් (PWUD/PWID) සහ සංචාරක සේවා සපයන්නන් සමඟ ලිංගිකව එක්වන පිරිමි යන මේ පිරිස් ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය විසින් ප්‍රධාන ජනගහන ලෙස අර් ථ දක්වයි. මීට අමතරව, තරුණයින්, කාන්තාවන් සහ ගැහැණු ළමයින්, සංක්‍රමණික කම්කරුවන් සහ එච්. අයි. වී. සහ/හෝ ක්ෂය රෝගයට ගොදුරු වන, අවදානමට ලක්වන හෝ අවදානමට ලක්විය හැකි ඕනෑම ජනගහනයක්/ප්‍රජාවක් හෝ කණ්ඩායමක්, එච්. අයි. වී. සහ ක්ෂය රෝගයට ගොදුරු විය හැකි ජනගහනයක් ලෙස KPTF විසින් හඳුනාගෙන ඇත.

එච්. අයි. වී. සමඟ ජීවත් වන පුද්ගලයින් (PLHIV) සහ ක්ෂය රෝගය සමඟ ජීවත් වන පුද්ගලයින්(PLTB) ද එච්. අයි. වී. සහ ක්ෂය රෝග ප්‍රතිචාර සඳහා ප්‍රධාන ජනගහනයන් ලෙස ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය (KPTF) විසින් හඳුනාගෙන ඇත.

## 2. අරමුණු

### 2.1 පොදු අරමුණ

**නතු කරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණය (AIDS) සහ ක්ෂයරෝගය වසංගත ලෙස ශ්‍රී ලංකාව තුළ සහතික වශයෙන්ම අවසන් කිරීම සඳහා ක්‍රියාත්මක එච්. අයි. වී. සහ ක්ෂය රෝග සේවාවන් කරා ළඟා වීමේ දී ප්‍රජාවන් සහ සිවිල් සමාජ මුහුණ දෙන අභියෝග වලට විසඳුම් සෙවීම සඳහා නැඹුරු වූ ප්‍රවේශයකින් ක්‍රියා කිරීම ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ අරමුණයි.**

### 2.2 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ විශේෂිත අරමුණු වන්නේ:

#### 2.2.1 වැඩසටහන් සහ වැඩසටහන් සැලසුම

- ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීම සඳහා ගෝලීය අරමුදලේ ජාතික ක්‍රියාවලීන්හි ප්‍රජාවන් සහ සිවිල් සමාජ අර්ථවත් ලෙස සම්බන්ධ වීම සහතික කිරීම (ගෝලීය අරමුදල) එච්. අයි. වී. සහ ක්ෂය රෝග ප්‍රතිචාර තුළ ඔවුන්ගේ අර්ථවත් නියැලීම සහතික කිරීම සඳහා එච්. අයි. වී. සහ ක්ෂය රෝග ප්‍රතිචාර වල දී ප්‍රජාවන්, සිවිල් සමාජ, සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංවිධාන / ප්‍රජා මූලික සංවිධාන මුහුණ දෙන අභියෝග සඳහා ප්‍රායෝගික විසඳුම් ක්‍රමෝපායයන් මාර්ගගත කිරීම සහ හඳුනා ගැනීම

#### 2.2.2 සන්නිවේදනය

- ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය සහ ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් ගන්නා උපාය මාර් ගික තීරණ පිළිබඳව දැනුම් දීම පිණිස ප්‍රජාවන් සහ සිවිල් සමාජය සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංවිධාන / ප්‍රජා මූල සංවිධාන සමග සහ එම පාර්ශවයන් අතර ද්වි-දිශානුගත සන්නිවේදනය සහතික කිරීම

### 2.2.3 මූල්‍යකරණය සහ තිරසාරභාවය

- එච්. අයි. වී. සහ ක්ෂය රෝග ප්‍රතිචාර තුල තිරසාරභාවය සහ උද්දේශනය වෙනුවෙන් සම්බන්ධ වීමට ප්‍රජාවන් සහ සිවිල් සමාජ වලට පහසුකම් සැලසීම.
- එච්. අයි. වී. සහ ක්ෂය රෝග ජාතික ප්‍රතිචාර තුළ ප්‍රජාව සහ සිවිල් සමාජ හවුල්කරුවන්ගේ සම්බනය පැවැත්වීම සහ ප්‍රජාවේ හා සිවිල් සමාජ සංවිධාන වල තිරසාරභාවය වෙනුවෙන් පෙනී සිටීම සහ බලපෑම් කිරීම.

### 2.2.4 ධාරිතා වර්ධනය

- එච්. අයි. වී. හා ක්ෂය රෝග ප්‍රතිචාර සඳහා අර්ථවත්ව සම්බන්ධවීමේ හැකියාව වර්ධනය වෙනුවෙන් ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සහ ප්‍රජාපාදක සංවිධාන වලට අවස්ථා සැපයීම සහ සම්පත් යොමු කිරීම පිණිස උද්දේශනය සිදු කිරීම

ගෝලීය අරමුදල විසින් සහාය දක්වන ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන් ඔබ්බට සහ ඊට ඉහළින් එහි කාර්යභාරය පිළිබඳව ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායට වැටහීමක් ඇත. දේශීය සම්බන්ධීකරණ කමිටුව (CCM), ජාතික ලිංගාශ්‍රිත රෝග ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP), ජාතික ක්ෂය රෝග සහ ළය රෝග මර්දන ජාතික වැඩසටහන (NPTCCD), තාක්ෂණික ආයතන සහ ශ්‍රී ලංකා රජය ඇතුළු ජාතික එච්. අයි. වී. සහ ක්ෂය රෝග පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවයෙන් ජාතික එච්. අයි. වී. සහ ක්ෂය රෝග ප්‍රතිචාරයන් තුළ අවබෝධයකින් සහ පුළුල් ලෙස සම්බන්ධ වීමට ප්‍රජාවන්ට සහ සිවිල් සමාජවලට අවකාශයක් සපයා දීමට එය අදහස් කරයි.

# 3. ප්‍රධාන ජනගහන බලකායේ සාමාජිකත්වය

## 3.1 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකත්ව සංයුතිය

- සංවිධාන නියෝජනය කරන උපරිමය 35ක් වන සාමාජික පිරිසකගෙන් ප්‍රධාන ජනගහන බලකා කමිටුව සමන්විත වේ.
- එක් සංවිධානයකින් එම සංවිධානය නියෝජනය පිණිස පත්කළ හැක්කේ එක් සාමාජිකයෙකු වන අතර, ප්‍රධාන ජනගහන බලකායේපසාමාජිකත්වය පිරිනැමෙන සංවිධාන ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය විසින් ප්‍රමුඛතා ගත කරනු ලැබේ.
- එච්. අයි. වී. හා ක්ෂය රෝග අවදානමට ලක්ව ඇති ප්‍රධාන ජනගහන සහ එම අවදානමට ලක්ව ඇතියවුන් විසින් නායකත්වය සපයන සංවිධාන.
- එච්. අයි. වී. සමග ජීවත් වන පුද්ගලයන් සහ ක්ෂය රෝගය සමග ජීවත් වන පුද්ගලයන්, පීඩාවට පත් වූ සහ/හෝ ක්ෂය රෝග අවදානමේ සිටින පුද්ගලයන් විසින් මෙහෙයවනු ලබන සංවිධාන.
- එච්. අයි. වී. සහ/හෝ ක්ෂය රෝගය සමග ජීවත් වන පුද්ගලයන්, පීඩාවට පත් වූ සහ/හෝ ඒවායේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහ සිවිල් සමාජයට සේවාවන් සපයනු ලබන සංවිධාන.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය තුල භූගෝලීය ප්‍ර දේශය, වයස, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, රෝග, ආදායම් මට්ටම්, සහ විවිධත්වය නියෝජනය විය යුතු ය.
- සියලුම සිවිල් සමාජ දේශීය සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන් පෙරනිමියෙන් ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයන් බවට පත්වේ.
- ජාතික ලිංගාශ්‍රිත රෝග ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP), ජාතික ක්ෂය රෝග සහ ළය රෝග මර්දන ජාතික වැඩසටහන (NPTCCD), දේශීය අරමුදල් නියෝජිත (LFA), ගෝලීය අරමුදල (GF) සහ දේශීය සම්බන්ධීකරණ කමිටු ලේකම් කාර්‍යාලයය නිරීක්ෂකයින් ලෙස ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය සමග සම්බන්ධ වනු ඇත.

## 3.2 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායට සාමාජියන් තෝරා ගැනීම

- විවෘත හා විනිවිදභාවයෙන් යුතු අයදුම් කිරීමේ ක්‍රියාවලියක් හරහා සාමාජිකයන් තෝරා ගත යුතු ය.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය විසින් සාමාජිකත්ව පූර්ව අවශ්‍යතා සහ අයදුම් කිරීමේ ක්‍රියාවලිය තීරණය කරනු ඇත.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය විසින් ද්වි-වාර් ශික සාමාජිකත්වය නැවත පුරවනු ඇත.

- සාමාජිකත්වය නැවත පිරවීම පිණිස අඩු වශයෙන් ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ තිදෙනෙකුගෙන්වත් සමන්විත වූ ආවස්ථික (ad hoc) තේරීම් කමිටුවක් පත් කළ යුතු ය.

## 3.3 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයෙකු වීම සඳහා අවශ්‍යතා

- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයෙකු වීමට කැමති යම් සංවිධානයක් ඇත්නම් ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා තේරීම් කමිටුවට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.
- එච්. අයි. වී. / ක්ෂය රෝග ප්‍රතිචාරයන්ට ඇති සහභාගිත්වයත්, එම රෝග වල අවදානමට ලක්විය හැකි ප්‍රධාන ප්‍රජාවන්ට සේවා සැපයීමත් සඳහා මැදිහත්වීම පිළිබඳව කරුණු ඔප්පු කිරීමට ඉල්ලුම්කරුවන්ට හැකි විය යුතු ය.
- ඉල්ලුම්කාර සංවිධානය විසින් තම සංවිධානය නම් කරන නියෝජිතයාව ප්‍රධාන ජනගහන බලකායට ලිඛිතව දැන්විය යුතු ය.
- නම් කරන ලද සාමාජිකයාට කිසියම් රැස්වීමකට සහභාගී වීමට නොහැකි වන අවස්ථා වලදී සහභාගී වීම පිණිස සංවිධානය විසින් එක් අතිරේක නියෝජිතයෙකු නම් කළ හැක.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයෙකු වීමට කැමති සංවිධාන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී තිබිය යුතු ය.
- එච්. අයි. වී. / ක්ෂය රෝග ප්‍රතිචාර සහ ප්‍රධාන හා අවදානමට ලක්විය හැකි ජනගහණයන් සමඟ ඔවුන්ගේ කටයුතු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර ලියාපදිංචි නොකළ සංවිධාන වලට ද අයදුම් කළ හැකිය.

## 3.4 ආවස්ථික ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා කමිටු සාමාජිකයෙකු ගේ කාර්‍යභාරය

- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා සාමාජිකයන් සමග සාකච්ඡා කොට ද්වි-වාර්ෂික සාමාජිකත්වය සඳහා බඳවා ගැනීමේ පූර්ව අවශ්‍යතා සහ කාල රේඛාව තීරණය කිරීම.
- ප්‍රමාණවත් තරම් අයදුම් පත් ගෙන්වා ගැනීම පිණිස අයදුම් පත් කැඳවීම සම්බන්ධ දැන්වීම බහුවිධ මාර්ග හරහා පතුරුවා හැරීම.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය සමග සාකච්ඡා කොට නව සාමාජිකයන් තෝරා ගැනීම පිළිබඳ නිර්ණායකයන් සැකසුම අවසාන කිරිම.
- තෝරා ගෙන කෙටි ලැයිස්තු ගත කළ අයදුම් පත් අනුමැතිය සඳහා ප්‍රධාන ජනගහන බලකාය වෙත ඉදිරිපත් කිරීම.
- ආරාධනා යැවීම පිණිස අවසාන ලැයිස්තුව ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සභාපති වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායට තෝරා ගත් සාමාජිකයන් වෙතින් භූගෝලීය ප්‍රදේශය, වයස, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂභාවය, රෝග, ආදායම් මට්ටමේ විවිධත්වය සහ එවැනි තවත් අදාල කරුණු නියෝජනය වන බවට වග බලා ගැනීම.

## 3.5 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකා සාමාජිකයන් ගේ භූමිකාව සහ වගකීම්

- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සියළු රැස්වීම් වලට සහ සියළු සාකච්ඡා වලට සක්‍රියව සහ අර්ථවත් ලෙස සහභාගි වීම.
- ප්‍රධාන සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ සහ අදාල සහභාගිත්ව කොට්ඨාශවල (constituencies) වල අභියෝගයන් සහ උත්සුකයන් (concerns) සඳහා ප්‍රගතිශීලී විසඳුම් සහ නිර්දේශ සපයා ගැනීම පිණිස ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය සමග ක්‍රියාශීලීව සම්බන්ධවීම.
- ප්‍රධාන සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ සහ අදාල සහභාගිත්ව කොට්ඨාශවල (constituencies) හඬ ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාකච්ඡා වලට යොමු කිරීමට වග බලා ගැනීම.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය සහ අදාල කණ්ඩායම් අතර ද්වි-දිශානුගත සන්නිවේදනය තහවුරු කිරීමට වග බලා ගැනීම..

- ප්‍රධාන සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ සහ අදාල සහභාගිත්ව කොට්ඨාශ (constituencies) මුහුණ දෙන අභියෝගයන්ට විසඳුම් සෙවීම සඳහා වූ උද්දේශන ප්‍රයත්නයන් වෙනුවෙන් පෙනී සිටීමට සහ ක්‍රියාත්මක කිරීමට සාමූහිකව උපාය මාර්ගයන් සකස් කිරීම.
- ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායෙහි දී සාකච්ඡාවට බඳුන් කළ ප්‍රස්තුතයන්, සැළකිල්ල යොමු කළ යුතු දේ සහ අභියෝග දේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම පිණිස ප්‍රමුඛතාගත කිරීම.

## 3.6 ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ සාමාජිකත්වය දරණ දේශීය සම්බන්ධීකරණ කමිටුවේ සිවිල් සමාජ සාමාජිකයින්ගේ භූමිකාවන් සහ වගකීම්

- එක් එක් ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ රැස්වීමක් අවසානයේ, එහි දී මතු වූ ගැටළු සහ සැළකිලිමත් විය යුතු දේ දේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී ඉදිරිපත් කිරීම පිණිස ප්‍රමුඛතාගත කිරීම.
- ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ රැස්වීමේ දී මතු වූ ගැටළු සහ සළකිලිමත් විය යුතු දේ දේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී අර්ථවත් ලෙස ඉදිරිපත් කිරීමට වග බලා ගැනීම.
- ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායෙහි දී හි මතුවන ගැටළු සහ උත්සුකයන් සඳහා විසඳුම් සෙවීම, එම ප්‍රතිඵල දේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල දී දැනුම් දීම, සහ ප්‍රධාන ජනගහන බලකා කමිටුව සමඟ තීරණ ගැනීමේ කරුණු දැනුම් දීම පිණිස ක්‍රියාකාරීව පසු විපරම් කිරීම.
- දේශීය සම්බන්ධීකරණ කමිටු න්‍යාය පත්‍රයට ඇතුලත්කළ යුතු ප්‍රධාන අයිතමයන් හඳුනා ගැනීම සඳහා ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායෙන් විමසීම.
- දේශීය සම්බන්ධීකරණ කමිටු සාකච්ඡා පිළිබඳව නිතිපතා ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකාය වෙත යොමුවීම
- ආධාර ඉල්ලීම් සකස් කිරීම, වැඩසටහන අධීක්ෂණය, වැඩසටහන් නැවත සැකසුම ආදියේ දී නිතිපතා අර්ථවත්ව ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායෙන් විමසීම.
- කෙටුම්පත් කිරීමේ අදියර සහ අයවැය සාකච්ඡා කිරීමේ අදියර ඇතුළුව මුළු රටටම අදාල සංවාද ක්‍රියාවලියෙහි ප්‍රජාවන් සහ සිවිල් සමාජ අර්ථවත් ලෙස නියැලී සිටින බවට වගබලා ගැනීම.

## 3.7 සාමාජිකත්වය අවසාන කිරීම

- නොපැමිණීමට හේතු දක්වා අනුමැතිය ලබා නොගෙන පීඩාවට පත් ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ රැස්වීම් වාර තුනකට (3) අඛණ්ඩව සහභාගි නොවුනහොත් සාමාජිකත්වය අවසන් වේ.
- සාමූහික තීරණ ගැනීම සඳහා ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ වෙත තම නිර්දේශ ඉදිරිපත් කරන තාවකාලික විමර්ශන කමිටුවක් පිහිටුවීම හරහා පහත සඳහන් දෑ ක්‍රියාත්මක කෙරේ.
  - යම් සාමාජිකයෙකු හෝ සාමාජික සංවිධානයක් ප්‍රධාන සහ අවදානමට ලක්විය හැකි ජනගහනයේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නේ නම් සාමාජිකත්වය අවසන් කරනු ලැබේ
  - යම් සාමාජිකයෙකු හෝ සාමාජික සංවිධානයක් වංචා හෝ දූෂණ සිදු කර ඇති බවට ඔප්පු වුවහොත් සාමාජිකත්වය අහෝසි කරනු ලැබේ.
  - යම් සාමාජිකයෙක් හෝ සාමාජික සංවිධානයක් විසින් ප්‍රධාන ජනගහන බලකායේ අරමුණු ඉටු නොකරන්නේයැයි කමිටු සාමාජිකයන් බහුතරයක් විසින් තීරණය කරන්නේ නම් සාමාජිකත්වය අවසන් කරනු ලැබේ.

## 3.8 ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ සභාපති, උප සභාපති සහ ලේකම් පත්කිරීම

- ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකායේ සභාපතිව නම් යෝජනා කිරීමේ - සභා සම්මත කිරීමේ ක්‍රමයක් මගින් තෝරා ගනු ලැබේ. එසේ වුව ද, ප්‍රධාන ජනගහන බලකා කමිටු සභාපති දේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයෙකු විය යුතු ය.
- ප්‍රධාන ජනගහන කාර්යසාධක බලකා කමිටුවේ උප සභාපතිව යෝජනා කිරීමේ - සභා සම්මත කිරීමේ ක්‍රමයක් මගින් තෝරා ගත යුතු අතර දේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.

### 3.9 ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සභාපති/උප සභාපති දෙපලගේ භූමිකාවන් සහ වගකීම්

- දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලයය සමග සහයෝගයෙන් සෑම දේශීය සම්බන්ධිකරණ කමිටු රැස්වීමකට පෙර නිතිපතා ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායෙහි රැස්වීම් පැවැත්වීම.
- දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලයය සමග සහයෝගයෙන් දේශීය සම්බන්ධිකරණ කමිටුවේ සිවිල් සමාජ සාමාජිකයන් සහ ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායෙහි සාමාජිකයන් එක්ව, එක් එක් රැස්වීම සඳහා න්‍යාය පත්‍රය කෙටුම්පත් කර අවසාන කිරීම.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ රැස්වීම් වල දී මතුවන ගැටළු/උත්සුකයන් (concerns) දේශීය සම්බන්ධිකරණ කමිටුවෙහි දී ඵලදායී ලෙස මතු කිරීමට වගබලා ගැනීම සඳහා සිවිල් සමාජ දේශීය සම්බන්ධිකරණ කමිටු සාමාජිකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- භෞතික රැස්වීම් හෝ මාර්ගගත රැස්වීම් හෝ විද්‍යුත් තැපැල හරහා එක් එක් දේශීය සම්බන්ධිකරණ කමිටු රැස්වීමේ ප්‍රතිඵල පිළිබඳව ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය වෙත කෙටියෙන් විස්තර සැපයීම.
- ජාතික ගෝලීය අරමුදල් ප්‍රදාන සම්බන්ධයෙන් අදාළ සහ වැදගත් තොරතුරු ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකාය සමග නිතිපතා සහ නියමිත වේලාවට බෙදා ගැනීම.
- දේශීය සම්බන්ධිකරණ කමිටුව මට්ටමින් සියලුම ගෝලීය අරමුදල් ක්‍රියාවලීන්හි සිවිල් සංවිධාන සහ ප්‍රජාවන් අර්ථවත් ලෙස සම්බන්ධ කර ගැනීම වෙනුවෙන් පෙනී සිටීම.

### 3.10 ලේකම් ගේ කාර්‍යභාරය

- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ රැස්වීම් වාර්තා දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලය සමග සහයෝගයෙන් ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සාමාජිකයන් වෙත භාෂා තුනෙන්ම බෙදා හැරීම.
- ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ රැස්වීම් වාර්තා පිළිවෙලට සංරක්ෂණය කිරීමට වග බලා ගැනීම/ රැස්වීම කැඳවීමට සහ සංවිධානය කිරීමට ප්‍රධාන ජනගහන කාර්‍යසාධක බලකායේ සභාපති/උප සභාපති සහ දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලයයට සහායවීම.

## 4. පීඩාවට පත් ප්‍රධාන ජනගහන බලකා කමිටු රැස්වීම් පැවැත්වීම

- ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකා කමිටු රැස්වීම් එහි සම්පූර් ණ සාමාජිකත්වයෙන් අවම වශයෙන් 50% (2/3) සහභාගිත්වයෙන් පැවැත්විය යුතු ය.
- සභාපතිවරයා විසින් දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලයය සමග සාකච්ඡා කර රැස්වීමේ දිනය අවසාන වශයෙන් තීරණය කර, පීඩාවට පත් ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකායේ සාමාජිකයන්ට ආරාධනා කළ යුතු වේ.
- අදහස් සහ යෝජනා ලබා ගැනීමට ඉඩ ලැබෙන සේ රැස්වීම පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින හතකට (07) පෙර සභාපතිවරයා විසින් ප්‍රධාන ජනගහන සභාපතිවරයා විසින් බලකායේ රැස්වීමට අදාල න්‍යාය පත්‍රය චක්‍රණය කළ යුතු වේ.
- සියලුම පීඩාවට පත් ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකායේ රැස්වීම් බහුතර සහභාගිවන්නන් අතර පොදු භාෂාව මත පදනම්ව සිංහල හෝ දෙමළ භාෂාවෙන් පවැත්විය යුතු ය. දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලයයේ සහාය ඇතිව පරිවර්තනය අවශ්‍ය අයට පරිවර්තන පහසුකම් ලබාදිය යුතු වේ.
- ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකායේ රැස්වීම් වාර්තා දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්‍යාලය විසින් භාෂා තුනෙන්ම බෙදා හරිනු ඇත.

## 5. තීරණ ගැනීමේ ක්‍රියාවලිය

- ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකාය විසින් සියළුම තීරණ ගනු ලබන්නේ රැස්වීම් වල දී ගැඹුරු සහ අර්ථවත් සාකච්ඡා වලින් අනතුරුවය.
- බලකාය තුල තීරණ ගැනීම සඳහා අවශ්‍ය වේ නම් ප්‍රධාන ජනගහන කාර්‍ය සාධක බලකායේ සභාපති විසින් ඡන්ද විමසීමක් සිදු කරණු ඇත.

## 6. සන්නිවේදනය

### 6.1 දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්යාලය සහ ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකාය අතර සන්නිවේදනය

- දේශීය සම්බන්ධිකරණ කමිටුවෙහි කටයුතු සහ තීරණ පිළිබඳව ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකාය යාවත් කිරීම පිළිබඳ වගකීම සිවිල් සමාජ සංවිධාන දේශීය සම්බන්ධිකරණ කමිටු සාමාජිකයන් වෙත පැවරේ.
- සෑම ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ රැස්වීමක් ආරම්භයේ දීම සිවිල් සමාජ සංවිධාන නියෝජනය කරන දේශීය සම්බන්ධිකරණ කමිටු සාමාජිකයන් විසින් පෙර පවත්වන ලද දේශීය සම්බන්ධිකරණ කමිටු රැස්වීම් පිළිබඳව යාවත්කාලීන කිරීමක යෙදෙනු ඇත.
- සෑම දේශීය සම්බන්ධිකරණ කමිටු රැස්වීමකින් පසුව, සිවිල් සංවිධාන දේශීය සම්බන්ධිකරණ කමිටු සාමාජිකයින්විසින් එම රැස්වීමේ ක්ෂණික ප්‍රතිඵල ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් සමඟ විද්‍යුත් තැපෑලෙන් බෙදා ගනු ඇත.

### 6.2 ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකාය සහ සහභාගිත්ව කොට්ඨාශ අතර සන්නිවේදනය

- සියළුම ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ සාමාජිකයන් වෙත, ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ (සහ දේශීය සම්බන්ධිකරණ කමිටුවේ) රැස්වීම් වල ප්‍රතිඵල තමන්ගේ සහභාගිත්ව කොට්ඨාශ වලට (constituencies) දැන්වීමේ වගකීම පැවරේ.
- සහභාගිත්ව කොට්ඨාශ (constituencies) සමග ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ සන්නිවේදනය පවත්වා ගැනීම පිණිස සන්නිවේදන උප කමිටුවක් පත් කෙරෙනු ඇත.

### 6.3 සන්නිවේදන උප කමිටුව

- ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ සාමාජිකයන් 3- 4 දෙනෙකු ගෙන් සමන්විත සන්නිවේදන උප කමිටුවක් එම බලකාය විසින් පත් කෙරෙනු ඇත.
- ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ ප්‍රතිඵල සම්බන්ධයෙන් සහභාගිත්ව කොට්ඨාශ (constituencies) වෙත දැන්වීමේ වගකීම සන්නිවේදන උප කමිටුව වෙත පැවරේ.
- ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ උපදෙස් විමසමින් සන්නිවේදන උප කමිටුව විසින් ප්‍රජා සහ සිවිල් සමාජ අවශ්‍යතා, උත්සුකයන් සහ නිර් දේශ ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකාය වෙත යොමු කිරීම පිණිස සහභාගිත්ව කොට්ඨාශ (constituencies) සමග උපදේශන දියත් කරනු ඇත.
- සිවිල් සංවිධාන වලින් පැමිණි දේශීය සම්බන්ධිකරණ කමිටුවේ සාමාජිකයන්, ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ සභාපති, සහ දේශීය සම්බන්ධිකරණ කමිටු ලේකම් කාර්යාලයෙන් උපදෙස් විමසමින්, ගෝලීය කමිටු ක්‍රියාවලීන් (දේශිය සංවාදය, අරමුදල් ඉල්ලීම, ප්‍රජා උපදේශන ආදී) හා සම්බන්ධ තොරතුරු නිතිපතා සහ කාලීනව සහභාගිත්ව කොට්ඨාශ සමග හුවමාරුව සඳහා වග බලා ගැනීම.
- බලකායේ සාමාජිකයන් සහ සහභාගිත්ව කොට්ඨාශ (constituencies) සමග සන්නිවේදනය පවත්වා ගැනීම සඳහා ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ අවශ්‍යතාවයන්ට අනුව සන්නිවේදන උප කමිටුව විසින් සන්නිවේදන වේදිකා (What's App group, Email List Serves ආදිය) ස්ථාපිත කර පවත්වා ගෙන යනු ඇත.

## 7. අනුකමිටු

ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායේ කාර්යයන්ට සහායවීම සඳහා අවශ්‍ය පරිදි අන්කමිටු පිහිටුවීම පිළිබඳව ප්‍රධාන ජනගහන කාර්ය සාධක බලකායට තීරණය කළ හැකි ය. මෙම අනුකමිටු වලට උපදේශක කමිටු, ආචාර ධර්ම කමිටු, පැමිණිලි කමිටු ආදිය ඇතුලත් විය හැකි නමුත් අනුකමිටු ඒවාට පමණක් සීමා වනිනේ නැත.